## සංක්ෂිප්තය

**වැසීයාමේ අවදානමට ලක් වූ බ/වලස්බැද්ද විද්‍යාලය සංවර්ධනය කිරීමෙහිලා විදුහල්පතිගේ දායකත්වය පිළිබඳ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක්**

ශ්‍රී ලංකාවේ අවාසිදායක පාසල් දිනෙන් දින පිරිහීමට ලක් ව කුඩා පාසල් බවට පත් වෙමින් අවසානයේ වැසී යයි. එවැනි ප්‍රවණතාවක් හමුවේ වුව ද තම ඉලක්ක සපුරා ගනිමින් සුවිශේෂී ලෙස පිරිහීමට එරෙහි ව සංවර්ධන මාවතට පිවිස ගමන් ගන්නා ආදර්ශවත් පාසල් කුඩා ප්‍රමාණයක් ක්‍රියාත්මක වීම අධ්‍යයනයට ලක් විය යුතු කරුණකි. 1997 දී පිරිහී වසා දැමීමට යෝජිත ව පැවති කුඩා පාසලක් වූ බ/වලස්බැද්ද විද්‍යාලයට පත්වීමක් ලැබ එන විදුහල්පතිවරයා පාසලේ පිරිහීයාම වළක්වා සංවර්ධන මාවතට පාසල ප්‍රවේශ කර ලීමටත්, ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතිය තුළ සුවිශේෂී පාසලක් ලෙස ආදර්ශ සපයා ඇත. බ/වලස්බැද්ද විද්‍යාලයේ පිරිහීයාම වළක්වාලීමටත්, සංවර්ධනයටත් විදුහල්පතිවරයාගේ කළමනාකරණ කුසලතා දායක වී ඇත්තේ කෙසේ ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනය මගින් සිදු කරන ලදී. ඒ සඳහා වැසීයාමේ අවදානමෙන් පාසල මුදවා ගැනීම හා සංවර්ධනය කිරීමෙහිලා බ/වලස්බැද්ද පාසල තුළ සිදු වූ ක්‍රියාදාමය හඳුනා ගැනීම, විදුහල්පතිගේ සංකල්පනාත්මක, මානව සම්බන්ධතා හා තාක්ෂණික යන කළමනාකරණ කුසලතා බලපා ඇති ආකාරය විමසා බැලීම යන අරමුණු ඔස්සේ පර්යේෂණය ක්‍රියාත්මක කරන ලදි

මෙම අධ්‍යයනය සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ සම්මිශ්‍රිත ක්‍රමය යොදා ගන්නා ලද සිද්ධි අධ්‍යයනයකි. ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීම සඳහා පර්යේෂණ උපකරණයක් ලෙස ප්‍රශ්නාවලියක් විදුහල්පති, පාසලේ සමස්ත ගුරු මණ්ඩලය, පාසලේ සිසුන් 10 දෙනෙකු හා පාසල අයත් අධ්‍යාපන කොට්ඨාසයේ නිලධාරීන් 08 දෙනෙකු සඳහා යොමු කෙරිණ. ගුණාත්මක දත්ත ලබා ගැනීම සඳහා විදුහල්පතිවරයා සමග ගැඹුරු සම්මුඛ සාකච්ඡාවක් ද, විදුහල්පතිවරයා හා නියෝජ්‍ය විදුහල්පතිවරයා සමග අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡාවක් ද, කණ්ඩායම් සාකච්ඡාවක් ප්‍රජාව ඉලක්ක කර ගෙන ද මෙහෙයවී ය. ඊට අතිරේක ව පාසලේ විවිධ ලේඛන ද, අදාළ හඬ පට, වීඩියෝ පට මෙන් ම නිරීක්ෂණයන් ද සිදු කරන ලදී. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රතිශත, වගු, ප්‍රස්තාර සටහන් ආදී සංඛ්‍යානමය ක්‍රම යොදා ගත් අතර ගුණාත්මක දත්ත විශ්ලේෂණය අදාළ ගුණාත්මක දත්ත ගැඹුරෙන් විමසුමට ලක් කරන ලදී.

ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත සම්මිශ්‍රණය කරමින් විදුහල්පතිවරයාගේ කළමනාකරණ කුසලතා පාසලේ පිරිහීම වැලැක්වීමට මෙන් ම පාසල සංවර්ධනයට දැක් වූ දායකත්වය සංසන්දනාත්මක දත්ත ත්‍රිකෝණීකරණයට ලක් කරන ලද අතර අධ්‍යයනය මගින් පෙනී ගියේ විදුහල්පතිවරයා සතු සංකල්පීය හා මානව සබඳතා පිළිබඳ කුසලතා ඉතා ඉහළ අයුරෙන් පාසලේ පිරිහීම වැළැක්වීමට මෙන් ම සංවර්ධනයට ද දායක වී ඇති ආකාරයයි. විදුහල්පතිවරයාගේ තාක්ෂණික කුසලතා ද පාසලේ පිරිහීයාම වැලැක්වීමට හා සංවර්ධනයට සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් දක්වා ඇත. පිරිහී වසා දැමීමට යෝජිත ව පැවති පාසලෙහි 1997 දී නායකත්වය බාර ගන්නා විදුහල්පතිවරයාගේ කළමනාකරණ කුසලතා සම්මිශ්‍රණය බ/වලස්බැද්ද පාසලේ පිහිරීයාම වලක්වා සංවර්ධන ප්‍රවේශයට ප්‍රබල ලෙස දායක වී ඇති බව අධ්‍යයනය මගින් අනාවරණය වේ.

# Abstract

**A Case study: Contribution of Principal's Management skills in developing a near Closure School**

**( B/ Walasbeddha Vidyalaya)**

There has been a tendency of gradual deterioration of the conditions of small schools and finally closure of majority of them, situated mostly in the peripheral areas of the country. However, there are exceptions where some very few schools exhibit a complete deviation from the typical behavior of small schools and display a significant development. This study was undertaken in one such school which was considered near closure school, in 1997 but developed to a well-developed model school within a few years after a new principal assumed duties. The main objective of the present study was to conduct an in-depth study of the principal's leadership quality in developing the school. The research specifically examined how the principals' management skills in terms of, conceptual skills, human skills, and technical skills contributed during the process of school development. The site of this research was B/ Walsbeddha vidyalaya; a near closure school situated in Bandarawela Education zone in the Uva province. The research design employed in achieving the above objective was a descriptive case study method following a mixed method. Quantitative data for this research was gathered through a questionnaire administered to the principal, all the teachers working in the school and a purposive sample of 10 students of the school, 8 officers from the zonal office. For the collection of qualitative data in depth interviews with the principal, semi structured interviews with the deputy principal, focused group discussions with parents were employed. In addition, content analysis of school documents such log books, attendant registers; observations, audios and videos provided a rich qualitative data base. The analysis of the quantitative data was mainly in percentages and these findings were mixed with relevant qualitative data for deep understanding of the case. The findings suggest that principals' leadership qualities such as skills related to conceptualization, technical and human relation management were blended by the principal in a more compatible pragmatic way with the culture of the school community in bringing about the drastic development of Walasbeddha school; a school near closure in 1997.